Examination of grade five students for selection to schools and for the award of bursaries

පාසල්වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස් වන ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන තරග විභාගය

I – පත්‍රය **කාලය - පැය 01යි**

කලාප අධ්‍යාපන කාර්යාලය - මිනුවන්ගොඩ

විභාග අංකය :.....

විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්:

* ඔබේ **විභාග අංකය** ඉහත දැක්වෙන කොටුව තුළ ඇති **තිත් ඉර මත** ලියන්න.
* **තුන්වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ **විභාග අංකය** ලියන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 60 ක් ඇත. සමහර ප්‍රශ්නවල අනුකොටස් ද ඇත.
* **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
* පිළිතුරු ලියන ලෙස උපදෙස් දී ඇති ප්‍රශ්නවලට **තිත් ඉරි මත** පිළිතුරු ලියන්න.
* පිළිතුරට යටින් ඉරක් අඳින්න යැයි උපදෙස් දී ඇති ප්‍රශ්නවල **නිවැරදි පිළිතුර තෝරාගෙන ඊට යටින් ඉරක් අඳින්න.**
* කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.


උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.


පිටු අංකය	ලැබූ ලකුණු
2	
3	
4	
5	
6	
7	
8	
එකතුව ඉලක්කමෙන්	
එකතුව අකුරෙන්	

	කෙටි අත්සන හා සංකේත අංකය
පළමුවන පරීක්ෂක ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම කළ බව සහතික කරමි.	V/II/S
දෙවන පරීක්ෂක පළමුවන පරීක්ෂක කර ඇති ඇගයීම නිවැරදි බව සහතික කරමි.	V/II/S
ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක ඇගයීම් කර, ප්‍රදානය කළ ලකුණු සහ එකතුව නිවැරදි බව තහවුරු කරමි.	V/II/S/EMF
ප්‍රධාන පරීක්ෂක අධීක්ෂණය කළෙමි. එකතුව නිවැරදි ය.	V/II/S/CH


[දෙවැනි පිටුව බලන්න.

1. මුල් රූපයේ ඇති සියලු ම කොටස් අඩංගු පිළිතුර තෝරන්න.






(1)




(2)



(3)


2. මෙම රූප වලින් දැක්වෙන සතුන් කාණ්ඩ තුනකට වෙන් කළ හැක.එම කාණ්ඩ තුන වන්නේ,




A




B




C



D



E




F

(1) A,E,B,D,C,F


(2) A,E,B,C,D,F

(3) C,D,B,F,A,E

3. මෙම රූප වලින් දක්වා ඇති ද්‍රව්‍ය කාණ්ඩ දෙකකට වෙන් කළ හැක.එම කාණ්ඩ වන්නේ,




A



B



C




D

(3) A,B,C,D,


(2) A,C,B,D

(1) A,D,B,C


4. අසමාන රූපය තෝරන්න.



(1)




(2)



(3)

5. රූපයේ අඩු කොටස සම්පූර්ණ කරන්න.





(1)



(2)



(3)

6.

21	23	27	24	25	22	26

ඉහත දැක්වෙන සංඛ්‍යා ආරෝහණ පටිපාටියට සැකසීම සඳහා සංඛ්‍යා කීයක පිහිටීම වෙනස් කළ යුතු ද?

i. 4 ii. 5 iii. 6


7. පළමු වචන දෙක අතර සම්බන්ධය හඳුනාගෙන තුන්වන පදය තෝරන්න.

වැව : සොරොව්ව නම් ලියද්ද: .....


i. වක්කඩ ii. කෙත iii. කුඹුර

8. පහත සංකේතවල නිවැරදි සම්බන්ධය නිරූපණය වන පිළිතුර තෝරන්න.


○ කලාපය □ කොට්ඨාසය △ පළාත ⊠ පාසල



(1)





(2)




(3)

9. රටාවට අනුව හිස්තැනට ආ යුතු පිළිතුර තෝරන්න.









i. 110 ii. 109 iii. 108

10. මෙහි දැක්වෙන රූපයේ සෘජුකෝණ ගණන වන්නේ



i. 16 ii. 12 iii. 10

11. පාට කළ කොටස දශම සංඛ්‍යාවක් ලෙස දක්වා ඇති පිළිතුර තෝරන්න.



i. 0.5 ii. 0.3 iii. 0.4

12. සඳ ද සිනිඳු රැස් කඳු
නොහෙලා බිම එක බඳු
වලාකුළින් පිරිසිදු
පෙරා එවයි බිඳු බිඳු

1) සියල්ලම එකවර යන අදහස කවියේ යෙදී ඇත්තේ කෙසේ ද?

i. බිඳු බිඳු ii. එක බඳු iii. රැස් කඳු


13. සඳ එකවර බිම නොහෙලන්නේ මොනවා ද?

i. හිරු රැස් ii. වළාකුළු iii. සඳ රැස්

14. 2010 වර්ෂය අයත් සියවස හා දශකය වන්නේ,


i. විසිවන සියවසේ පළමු දශකය
ii. විසිඑක්වන සියවසේ පළමු දශකය
iii. විසිඑක්වන සියවසේ දහවන දශකය

15. කඩයක සැමන් ටින් අසුරා ඇත්තේ පහත ආකාරයටය.මෙලෙස ටින් 36ක් ඇසුරුවහොත් එහි යටම තට්ටුවේ ඇති සැමන් ටින් ගණන වන්නේ,



i. 6
ii. 8
iii. 7

16. A සිට F තෙක් නම්කළ එකම ඝනකයක අවස්ථා කිහිපයකි. A ට විරුද්ධව ඇත්තේ,



i. B
ii. E
iii. F

17. ෂෙවෝන් මීට වසර 4කට පෙර ඔහුගේ 10වන උපන් දිනය සැමරුවේ ය.එවිට ඔහුගේ නංගීගේ වයස 6කි.නවත් අවුරුදු 5ක් ගත වූ විට ෂෙවෝන්ගේ හා නංගීගේ වයස් පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

i. අවුරුදු14,10 ii. අවුරුදු19,15 iii. අවුරුදු10,6

18. මගේ යහළුවනුත් මමත් අලුත් අවුරුදු සුභ පැතුම් පත් හුවමාරු කර ගත්තෙමු.අප සියළු දෙනාම එකිනෙකාට එක බැගින් හුවමාරු කර ගත් සුභ පැතුම් පත් සංඛ්‍යාව 30කි.මගේ යහළුවන් ගණන කොපමණ ද?

i. 6 ii. 5 iii. 7

19. මල් මාලයක සුදු ,රතු,කහ හා නිල් යන පිළිවෙළට මල් අමුණා ඇත.එහි මුලින්ම ඇත්තේ සුදු පාට මලකි.මල් මාලයේ මල් 53ක් තිබේනම් එහි ඇති රතු පාට මල් ගණන කොපමණ ද?

i. 12 ii. 13 iii. 14


20. ඉරිදා දින 5කින් යුත් මැයි මාසයක එම ඉරිදා දින එකතු කළ විට තිබිය හැකි වැඩිම අගය කීය ද?


i. 80 ii. 85 iii. 88


21. අවිශ්ක සිටි පෝළිමේ ඔහුට ඉදිරියෙන් මිනිසුන් හත්දෙනෙක් සිටගෙන සිටි අතර ඔවුන් සියළු දෙනාම අනෙක් පැත්තට හැරුණේ ය.එවිට අවිශ්කට ඉදිරියෙන් මිනිසුන් 4 දෙනෙකු සිටින්නේ නම් පෝළිමේ සිටි මුළු මිනිසුන් ගණන කොපමණ ද?


i. 11 ii. 12 iii. 13

22. පහත රූපයේ දැක්වෙන ආකාරයට සිදුරු කර නමා දිගහැරිය විට දිස්වෙන ආකාරයට අදාල පිළිතුර වන්නේ,











(1) (2) (3)


23. රූපයේ දැක්වෙන්නේ හරි හතරැස් ලී කුට්ටියකි.එහි මතුපිට සායම් ආලේප කර ඉරි දිගේ කුඩා කැබලි වලට කපා වෙන් කරනු ලැබේ.පැතිදෙකක පමණක් සායම් තැවරුණු කැබලි ගණන කීය ද?


i. 8
ii. 12
iii. 16




24. පහත ඝනකයේ පැති හයේම අකුරු යොදා තිබේ.ඔබට පෙනෙන පැත්තට විරුද්ධ පැත්තේ ද එම සංකේතයම ඇඳ ඇත.පෙට්ටිය දිග හැරිය විට දැක්වෙන නිවැරදි ආකාරය තෝරන්න.










(1) (2) (3)

25. පියා ළඟ තිබූ මුදලකින් ½ නිමල්ට ද ඉතිරියෙන් ¼ කමල්ට ද දුන් පසු රුපියල් 450.00 ඉතිරි විය.පියා ළඟ තිබූ මුළු මුදල වනුයේ,

i. රුපියල් 180.00 ii. රුපියල්1200.00 iii. රුපියල් 2400.00

26. දී ඇති රූපයේ හැඩතල පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක් ද?



i. සෘජුකෝණාස්‍ර දෙකක් හා සමචතුරස්‍ර එකක් ඇත.
ii. වෘත්ත ගණනත් ත්‍රිකෝණ ගණනත් සමාන ය
iii. ත්‍රිකෝණ මෙන් තුන් ගුණයක් වෘත්ත ඇත

27. ළමයින් කීපදෙනෙකුගේ වයස පහත දැක්වේ

අමල් + නිමල්	=	අවුරුදු 80
නිමල් + බණ්ඩාර	=	අවුරුදු 98
බණ්ඩාර + අමල්	=	අවුරුදු 94

අමල්ගේ වයස වන්නේ,

i. අවුරුදු 42 ii. අවුරුදු 38 iii. අවුරුදු 60

28. මල්ලක එකම තරමේ හා එකම හැඩයේ රතුපාට පබළු 6ක් ද නිල්පාට පබළු 4 ක් ද කොළ පාට පබළු 3ක් ද ඇත.වරකට එක බැගින් ගෙන එකම පාටින් යුතු පබළු දෙකක් අනිවාර්යයෙන්ම ගැනීමට ඉවතට ගත යුතු අවම පබළු ගණන කීය ද?

i. 6 ii. 4 iii. 5

29. ගයාන්,තුවාන්,නුවන් එක දිනයක පාඩම් කළ කාලය පහත දැක්වේ ගයාන් ප.ව 6.30 සිට ප.ව 9.30 දක්වා ද,තුවාන් ප.ව 5.45 සිට ප.ව 9.15 දක්වා ද නුවන් ප.ව 6.45 සිට ප.ව 10.00 දක්වා ද වේ.
මොවුන් තිදෙනාම එකවර පාඩම් කල කාලය කොපමණ ද?

i. පැය 2 මිනිත්තු 30 ii. පැය 2 මිනිත්තු 45 iii. පැය 3යි

30. මල්ලිගේ උපන්දිනය පෙරේදා බවත් අනිද්දා වන මැයි 25 වෙනි සිකුරාදා ඔවුන් චාරිකාවක් යන බවත් අමාලි පවසයි. එසේනම් අමාලිගේ මල්ලිගේ උපන්දිනය වන්නේ,

i. 21 සඳුදා ii. 23 බදාදා iii. 24 බදාදා

31. 1-100 තෙක් ලිවීමේ දී 9 සංඛ්‍යාව ලියවෙන වාර ගණන

i. 18 ii. 19 iii. 20

32. සියලුම කුරුල්ලන් ශාක භක්ෂක නොවේ.එසේනම්

i. සෑම කුරුල්ලෙක් ම ශාක ද්‍රව්‍ය ආහාරයට ගනී


ii. සෑම කුරුල්ලෙක් ම ශාක ද්‍රව්‍ය පමණක් ආහාරයට නොගනී


iii. සෑම කුරුල්ලෙක් ම ශාක ද්‍රව්‍ය පමණක් ආහාරයට ගනී

33. මිදුලේ එකම ස්ථානයක සිට තරංග සහ කවිඳු පිළිවෙලින් 10m ක් නැගෙනහිර දිශාවට හා 15 m ක් බටහිර දිශාවට ගමන් කර නවතී.අනතුරුව එතැන් සිට දෙදෙනාම 5 m බැගින් දකුණු දිශාවට ගමන් කර නතර වෙති.ඔවුන් දෙදෙනා දැන් සිටින ස්ථාන දෙක අතර දුර හා ඔවුන් දෙදෙනා ගමන් කළ මුළු දුර පිළිවෙළින් දැක්වෙන පිළිතුර කුමක් ද?

i. 60m 35 m ii. 35 m 25 m iii. 35 m 35 m

34. පහත ලී කැබලි දෙස A පැත්තෙන් බලන විට පෙනෙන ආකාරය තෝරන්න.





(1) (2) (3)

35. කොහු ලණුවක දිග 26m 85cm ය.එයින් 4m 30cm ප්‍රමාණයක් දිරා ගොස් ඇත.එම කොටස කපා ඉවත් කර ඉතිරි කොටස සමාන කොටස් 5කට කැපූ විට එක් කොටසක ප්‍රමාණය කොපමණ ද?

i. 4m 51cm ii. 4m 11cm iii. 5m 45cm

36. වස්තුවක මෙවැනි සෙවනැල්ලක් දැකිය හැකි වන්නේ කුමන වේලාවට ද?


i. පස්වරු 1.00 ට පමණ

ii. පස්වරු 6.00 ට පමණ

iii. පස්වරු 10.00 ට පමණ



37. රූපයෙන් දක්වා ඇත්තේ කුඩා ඝනක කීපයක් අසුරා ඇති ආකාරයයි.මෙහි අසුරා ඇති මුළු ඝනක ගණන කීය ද?



i. 12
ii. 20
iii. 17

38. ප්‍රශ්න 10ක් තිබෙන ප්‍රශ්න පත්‍රයක නිවැරදි පිළිතුරකට ලකුණු 10ක් ලබා දෙන අතර වැරදි පිළිතුරකට ලකුණු 2ක් අඩු කරයි.මේ අනුව ලකුණු 40ක් ලබාගත් ළමයෙක් නිවැරදිව ලියා ඇති ප්‍රශ්න ගණන කීය ද?

i. 5 ii. 6 iii. 4

39. පඩි 12ක් ඇති පඩිපෙළක නිමල් 12 වන පඩියේ සිටියි.කමල් දෙවැනි පඩියේ සිටියි.නිමල් පඩි තුනක් පහළට බහින විට කමල් පඩි දෙකක් ඉහළට නගී.ඔවුන් දෙදෙනා හමුවන්නේ කී වෙනි පඩියේ ද?

i. 8 ii. 6 iii. 4

40. බසයක පිරිමි මගීන් ගණන මෙන් සිව් ගුණයක් ගැහැනු මගීන් සිටී.පිරිමි මගීන් 18ක් බසයට ගොඩවුවහොත් ගැහැනු පිරිමි ගණන සමාන ය.බසයේ සිටින මුළු මගීන් ගණන කීය ද?

i. 24 ii. 30 iii. 36

Examination of grade five students for selection to schools and for the award of bursaries

පාසල්වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස් වන ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන තරග විභාගය

II – පත්‍රය **කාලය - පැය 01යි මිනිත්තු 15**

කලාප අධ්‍යාපන කාර්යාලය - මිනුවන්ගොඩ

විභාග අංකය :.....

විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්:

* ඔබේ **විභාග අංකය** ඉහත දැක්වෙන කොටුව තුළ ඇති **තීත් ඉර මත** ලියන්න.
* **තුන්වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ **විභාග අංකය** ලියන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 60 ක් ඇත. සමහර ප්‍රශ්නවල අනුකොටස් ද ඇත.
* **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
* පිළිතුරු ලියන ලෙස උපදෙස් දී ඇති ප්‍රශ්නවලට **තීත් ඉරි මත** පිළිතුරු ලියන්න.
* පිළිතුරට යටින් ඉරක් අඳින්න යැයි උපදෙස් දී ඇති ප්‍රශ්නවල **නිවැරදි පිළිතුර තෝරාගෙන ඊට යටින් ඉරක් අඳින්න.**
* කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.

පිටු අංකය	ලැබූ ලකුණු
2	
3	
4	
5	
6	
7	
8	
එකතුව ඉලක්කමෙන්	
එකතුව අකුරෙන්	

	කෙටි අත්සන හා සංකේත අංකය
පළමුවන පරීක්ෂක ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම කළ බව සහතික කරමි.	V/II/S
දෙවන පරීක්ෂක පළමුවන පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි.	V/II/S
ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක ඇගයීම් කර, ප්‍රදානය කළ ලකුණු සහ එකතුව නිවැරදි බව තහවුරු කරමි.	V/II/S/EMF
ප්‍රධාන පරීක්ෂක අධීක්ෂණය කළෙමි. එකතුව නිවැරදි ය.	V/II/S/CH

[දෙවැනි පිටුව බලන්න.

1• පහත දැක්වෙන ඡේදය කියවන්න.

අන්තිම රතු මිනිසාත් මේ පොළෝතලෙන් අතුරුදන් වූ විට ඔවුන් ගේ මතකය තණබිම් හරහා පාවෙන වලාකුළක ඡායාවක් බවට පත්වූ විට මේ තැනිතලා වනපෙත මගේ මිනිසුන්ගේ ජීවන සුවඳ ඉදිරියටත් රඳවා ගනු ඇත. අපගේ මිනිසුන් මෙම භූමියට ආදරය කළේ කිරි දරුවෙකු තම මවගේ හදවතේ රිද්මයට ආදරය කරන්නාක් මෙනි.'' සියැටෙල් ගේ හඬට සවන් දෙමින් අපිත් අපේ පරිසරය සුරැකීමට කටයුතු කරමු.

• ඡේදය ඇසුරින් පිළිතුරු සපයන්න.

(i) මෙහි කියැවෙන ලෙස පරිසරය පිළිබඳ හඬක් නගා එහි අගය ලොවට කියා ඇත්තේ කවුද?.

(ii) **නැතිවීගිය** යන අර්ථය දීමට ඡේදයේ යොදා ඇත්තේ කුමක්ද?.

(iii) මෙහි සඳහන් උපමාව කුමක්ද?.

(iv) පළමු යන්නට විරුද්ධ අර්ථයක් දැක්වෙන පදය ලියන්න.

(v) මෙම ඡේදයෙන් කියවෙන ලෙස අප කටයුතු කළ යුත්තේ කුමකටද?.

(vi) සෙවණැල්ලක් යන අදහස දෙන වචනය තෝරා ලියන්න, ----------

2• ප්‍රාණවාචී බහුවචන අතීතකාල ක්‍රියාපදය තෝරා යටින් ඉරක් අඳින්න.

(1) ගියෙමි (2) ගියෙමු (3) ගියාය.

3• වචන ගලපා අර්ථවත් වාක්‍යයක් සාදා ලියන්න.

අනුව / හේතුවක් / කාලසටහනකට / වැඩ /වේ/ දියුණුවට /කිරීම /

4• පහත පදවල යටින් ඉරක් ඇඳ ඇති අකුරේ ඇති පිල්ලමේ නම ලියන්න.

<u>රු</u>වල - ----------

<u>නෞ</u>කාව - ----------

5. ගැළපෙන විරාම ලකුණු යොදන්න.

අහෝ කොතරම් නුනුවණ කමෙක් ද

6. (i) පහත දැක්වෙන ප්‍රස්තාව පිරුළ සම්පූර්ණ කිරීමට සුදුසු වචන හිස්තැනෙහි ලියන්න.

රයිගමයයි ---------- වගේ.

(ii) පහත අවස්ථාවට ගැළපෙන ඉඟි වැකිය ලියන්න.

වගකීමෙන් මග හැර යාම - ----------

7. පහත සඳහන් එක් එක් වාක්‍යයෙහි නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය වරහන් තුළින් තෝරා හවින් ඉරක් අඳින්න.

(i) හෙට දිනයේ (කාලගුණය / කාළගුණය) පිළිබඳ අනාවැකි අපට ප්‍රයෝජනවත් වේ.

(ii) ලිලී අත්තම්මාට (සමුර්ධි / සමෘද්ධි) සහනාධාරය හැර වෙනත් ආදායමක් නැත.

8. පහත වාක්‍ය වර්තමාන කාලයට හරවා ලියන්න.

මඩොල් දූවට යන බව ඇසූ ළමා පිරිස සතුටින් ඉපිල ගියහ.

---

9. ස්ත්‍රී ලිංග පදය ලියන්න. දරුවා ----------

10. දී ඇති වාක්‍යවල ඉරි ඇඳ ඇති පදයේ ස්ත්‍රී ලිංග පදය යොදා වාක්‍යය නැවත ලියන්න.

I. <u>ගුරුතුමා</u> උදෑසන ම පාසලට ගියේ ය.

.....

II. <u>ගොවියා</u> දෑකැත්ත රැගෙන කුඹුරට යයි.


.....

11. එක් එක් ඉංග්‍රීසි වචනය සඳහා යෙදෙන **සිංහල** වචනය ලියන්න.

(i) caterpillar ----------

(ii) toothbrush ----------

12. එක් එක් රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචනය, **ඉංග්‍රීසි** අකුරෙන් ම ලියන්න.

(i)  ---------- (ii)  ----------

13. පහත දී ඇති වචන නිවැරදි ව ගළපා අර්ථවත් වැකියක් බැගින් ලියන්න.

(i) our / is / class room / This ‘ ----------

(ii) are / playing / cricket / We ‘ ----------


14 . සන්දෙ යන දෙමළ වචනය සඳහා යෙදෙන සිංහල වචනය ලියන්න.

---

15. පහත සඳහන් වාක්‍යය දෙමළෙන් කියන ආකාරය සිංහලෙන් ලියන්න.

කිරි බොන්න . ----------

16 . ගණක රාමුවේ පෙන්වන සංඛ්‍යාව අකුරෙන් ලියන්න.



----

17. ඉලක්කමෙන් ලියන්න.

අටදහස් විසිදෙක . ----------

18. පහත සංඛ්‍යා අවරෝහණ පිළිවෙළට ලියන්න.

2401 4102 1402 ---------- ---------- ----------

19. පහත කොටුවේ ඇති සංඛ්‍යා සියල්ලම යොදාගෙන පොදු අන්තරය 3වන සංඛ්‍යා රටාවක් ගොඩනගන්න.

	21	
15		12
18		9


- ----------

20. පාසලක සිටින සියලුම ළමුන් සංඛ්‍යාව 1705 කි. එම ළමුන් ට පැන්සල් 2 බැගින් හා පෑන් 3 බැගින් බෙදා දීමට කටයුතු යොදා ඇත. මේ සඳහා අවශ්‍ය

(i) පැන්සල් ගණන කීයද?. ----------

(ii) පෑන් ගණන කීයද ?. ----------

21. ඉදිරියෙන් දී ඇති රූපයෙන් $\frac{3}{4}$ ක් (පැන්සලෙන් හෝ පෑනෙන්) පාට කරන්න.



22; රාත්‍රී කාලයක පැය 12 ඔරලෝසුවේ පෙන්වන වේලාව පැය 24 ක්‍රමයට හිස්තැන තුළ ලියන්න .



:

23. 318 , 3 න් බෙදුවිට පිළිතුර කුමක්ද?. ----------

24. රුපියල් 75.00 ක අභ්‍යාස පොතක් සහ රුපියල් 12.50 ක පෑනක් මිලට ගැනීමට මා ළඟ ඇත්තේ රුපියල් 20 නෝට්ටු 3කි. තව කොපමණ මුදලක් අවශ්‍යද?. ----------

25. සිසිල් බීම ලීටර 1 මිලිලීටර 500 ක පරිමාවක් මිතුරන් හයදෙනෙකු අතර සමානව බෙදාගන්නා ලදී. එක් අයෙකුට ලැබුණු සිසිල් බීම පරිමාව කොපමණද?.

---


26. නිවසට ගෙන ආ කේක්වල බර 3 kg ය. එයින් 1 Kg 800g ප්‍රමාණයක් කපා ආහාරයට ගන්නා ලදී.

(i) නිවසේ ඉතිරිව ඇති කේක්වල බර කිලෝග්‍රෑම් හා ග්‍රෑම්වලින් කොපමණද,

----------Kg ----------g

(ii) ඉතිරි කේක්වලින් 150 g බර කේක් කෑලි කියක් කැපිය හැකිද?. ----------

27. රූපයේ දැක්වෙන ඝනවස්තුවේ ඇති දාර හා ශීර්ෂ ගණන හිස්තැන් මත ලියන්න.




දාර ---------- ශීර්ෂ ----------

28. නගරයක බස්නැවතුමේ සිට 850 m දුරින් බැංකුව පිහිටා ඇත. බැංකුවේ සිට 75 m දුරින් පාසල ද පාසලේ සිට 350 m දුරින් පොලිසියද පිහිටා ඇත. නිමල් බසයෙන් බැස බැංකුව හා පාසල පසුකර පොලිසිය වෙත පා ගමනින් ගියේය. ඔහු ඇවිදගිය දුර කිලෝමීටර හා මීටරවලින් සොයන්නත.

----------Km ----------m

29. සිසුන් කණ්ඩායමක් කැමති වර්ණ පිළිබඳව තොරතුරු ප්‍රස්තාරයේ නිරූපණය කර ඇත.



(i) කොළ වර්ණයට කැමති සිසුන් ගණන දම් වර්ණයට කැමති සිසුන් ගණන මෙන් තුන් ගුණයකි. දම් වර්ණයට කැමති සිසුන් ගණන ප්‍රස්තාරයේ ඇඳ දක්වන්න.

(ii) පන්තිකාමරයේ මුළු සිසුන් ගණන කීයද?.

- අංක **30** සිට **59** තෙක් එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුර, දී ඇති පිළිතුරු අතුරෙන් තෝරා **යටින් ඉරක්** අඳින්න.

30. සියලුම ජාතීන් ට පොදු සංකේත දෙකක් වන්නේ.

(1) ධර්ම චක්‍රය හා රාජ්‍ය ලාංඡනය

(2) ජාතික කොඩිය හා කුරුසය

(3) රාජ්‍ය ලාංඡනය හා ජාතික කොඩිය.

31. බෝවන නොවන රෝග වැළඳීමට බලපාන හේතු දෙකක් වන්නේ,

(1) අධික සීනි හා පිටි සහිත ආහාර ගැනීම , දුම්පානය

(2) ප්‍රෝටීන් සහත ආහාර ගැනීම හා වෙහෙස වී වැඩ කිරීම

(3) විටමින් සහිත ආහාර අඩුවෙන් ගැනීම , දුම්පානය

32. බිත්තර දැමීමෙන් තම වර්ගයා බෝකරන සත්ත්වයා වන්නේ.

(1) මීයා (2) මුගටියා (3) මකුලුවා.

33. කජු ශාකයේ බීජ ව්‍යාප්තියට වඩාත් උදව් වියහැකි සත්ත්වයා වන්නේ .

(1) මී මැස්සා (2) වවුලා (3) කපුටා

34. සේදීමෙන් පසු නොකපා ආහාරයට ගත හැකි ගෙඩිය දැක්වෙන රූපය වන්නේ,

(1)  (2)  (3) 

35. ශාක හා සත්ව කොටස් යන වර්ග දෙකේම ආහාර ගන්නා සත්ත්වයන් පමණක් ඇතුළත් පිළිතුර ,

(1) කපුටා , ගිරවා , උකුස්සා , කොකා

(2) බල්ලා , බළලා , හූනා , කපුටා

(3) මීයා , පරවියා , නයා , ගැරඬියා

36. තෙල් තුළ දමා බැඳීමෙන් සකස් කරගන්නා ආහාරයක් වන්නේ,

(1) වඩේ (2) පිට්ටු (3) ආප්ප.

37. මෙම උපකරණය භාවිත කෙරෙන්නේ කුමක් සඳහා ද



(1) ලීයක කුහරයක් සෑදීමට.

(2) ලීයක් කැමති හැඩයකට කැපීමට.

(3) ලියක් සුමටව සකස් කිරීමට .

38... වගා බඳුනක පතුළේ සිදුරු තැබීමෙන් බලාපොරොත්තු වන්නේ ,

(1) අනවශ්‍ය ජලය ඉවත් වීමට ඉඩ සැලසීම.

(2) මුල් පොළොවට යෑම පහසු වීමට.

(3) ජලය උරා ගැනීම පහසු වීමට .

39. හිරු එළියෙන් ජලය වාෂ්පීකරණය වීම ප්‍රයෝජනයට ගන්නා අවස්ථාවක් වන්නේ .

(1) කිරි මගින් යෝගට් සෑදීම.

(2) මුහුදු ජලය මගින් ලුණු සැකසීම.

(3) පලතුරුවලින් ජෑම් සැකසීම .

40 . අපිරිසිදු ජලය භාවිතයෙන් වැළඳිය හැකි රෝගයක් නොවන්නේ ,

(1) පාචනය (2) දියවැඩියාව (3) හෙපටයිටිස්.

41. දරුවෙකු නිවසක මෙහෙකාර සේවයේ යොදවන බව දැනගත් විට දැනුම් දිය යුතු දුරකථන අංකය වන්නේ .

(1) 1929 (2) 1919 (3) 119

42. පොදු වාහනයක ගමන් කරන මගියෙකු අනුගමනය කළයුතු යහ පුරුද්දක් දැක්වෙන පිළිතුර කුමක්ද?.

(1) පිටතට යම්යම් දේ විසි කිරීම
(2) ප්‍රවේශ පත්‍රයක් ලබා ගැනීම.
(3) පා පුවරුවේ ගමන් කිරීම

43. දිනපතා භාවිතයට සුදුසු ඖෂධිය පානයක් සාදාගත හැකි ශාක වර්ගයකි.

(1) රණවරා (2) භාතාවාරිය (3) කැතිරි

44 . ශක්තිමත් කම්බියක් කපා ගැනීමට වඩාත් සුදුසු උපකරණය දැක්වෙන රූපය කුමක්ද?



(1)



(2)





(3)


45. තණඩලේ දෙන්න දෙපොළේ දක්කනවා - කටුකැලේ ගාලෙ නොලිහා වද දෙනවා මෙය

(1) පතල් කවියකි (2) පාරු කවියකි (3) ගැල් කවියකි.

46. වියළිකෝෂයක් බල්බයක් හා කම්බි යොදාගෙන ළමයින් තුන්දෙනෙකු සෑදූ ඇටවුම් 3ක් පහත දී ඇත. බල්බය දැල්වෙන්නේ කුමන අවස්ථාවේදී ද ?.







(1) (2) (3)


47. අහසින් වැටෙන එක දියබිඳක් හෝ ප්‍රයෝජනයට නොගෙන මුහුදට ගලා යාමට ඉඩ නොදිය යුතුය යන කළේ කවුද?

(1) මහා පරාක්‍රමබාහු රජතුමා (2) ධාතුසේන රජතුමා (3) දුටුගැමුණු රජතුමා

48. ශ්‍රී පාදස්ථානය අපේ රටේ සියලුම ආගමිකයන්ගේ පුජනීය ස්ථානයකි. එය පිහිටා ඇති පළාත වන්නේ,

(1) සබරගමු පළාත (2) ඌව පළාත (3) මධ්‍යම පළාත

49. පාපැදියක රෝද දෙකෙහි රූපයක් පහත දීඇත. ඒ අනුව පාපැදිය පදිනවිට සිදුවන දේ පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.



(1) විශාල රෝදය ට වඩා සෙමින් කුඩා රෝදය කැරකේ.

(2) විශාල රෝදයට සමාන වේගයෙන් කුඩා රෝදය කැරකේ.

(3) විශාල රෝදයට වඩා වැඩි වේගයෙන් කුඩා රෝදය කැරකේ.

50. ගංවතුර නිසා සිදුවන හානි වැඩිකිරීමට හේතුවන මිනිස් ක්‍රියාකාරකමක් වන්නේ,

(1) පොලිතින් ප්ලාස්ටික් වැනි නොදිරන අපද්‍රව්‍ය පිළිස්සීම.


(2) ස්වභාවික ජලාශ අසල වාහන සේදීම.

(3) වගුරු බිම් ගොඩකර නිවාස ඉදිකිරීම.

51. සමන් හට කුසගින්න නොදැනීම . සම ඉරිතැලීම හා කට කොන් වණවීම යන රෝග ලක්ෂණ ඇති වී වෛද්‍යවරයෙකු යමුවිය. වෛද්‍යවරයා සමන් හට විටමින් වර්ගයක් අඩුවී ඇති බව කීවේය. එම විටමින් වර්ගය කුමක්ද?.


(1) විටමින් A (2) විටමින් B (3) විටමින් C

52. පහත රූපයේ දක්වා ඇති පැරණි චිත්‍රරටාව හඳුන්වන නම කුමක්ද?.



(1) පලාපෙති (2) ලියවැල් (3) අරිම්බුව

53. පහත දක්වා ඇති විසිතුරු මැහුම් ක්‍රමය කුමක්ද?.



(1) දම්වැල් මැස්ම (2) බිලැන්කට් මැස්ම (3) නූල් දිවවීම.

54. පින්තූර හා පණිවුඩ ක්ෂණිකවම විශාල පිරිසකට යැවීමට සුදුසු සන්නිවේදන ක්‍රමය වන්නේ,

(1) විද්‍යුත් තැපෑල (2) කටහඬ තැපෑල (3) ගුවන්විදුලිය.

55. ගෙවත්තේ සිටින ගොළුබෙල්ලන් තම ආහාරයට ලෙස ගන්නා සත්වයා වන්නේ ,

(1) පිළිහුඩුවා (2) ගිරවා (3) ඇටිකුකුළා

56. ගෙවත්තේ වගාකර ඇති එළවලු හා මල්පැළ අවට ඇති පස් බුරුල් කිරීම සඳහා යොදාගන්නා උපකරණය පහත ඒවායින් කුමක්ද.



(1) (2) (3)

57. "මගේ සිතට දැනෙන සැනසීම බෙදා දෙන්නට දැන්මට පුළුවන් " මෙය සිත්පහන් කිරීමේ ක්‍රියාකාරකම්වල කුමන පියවරද?.

(1) අධිෂ්ඨානය (2) ප්‍රාර්ථනාව (2) උදානය

58. අනාරක්ෂිත අවස්ථාවක් නොවන්නේ පහත ඒවායින් කුමක්ද?.

(1) අලි ඇතුන් ගමන් කරන මංකඩ


(2) රතිඤ්ඤා පත්තු කිරීම

(3) අකුණු අවස්ථාවක දී එළිමහනේ ගමන් බිමන් යෑම.

59. නිදහසේ දැහැන නම් පද්‍ය කාව්‍යයය රචනා කළ කතුවරයා පහත අය අතරින් තෝරන්න.



(1)



(2)



(3)

60. ”මා කැමතිම ක්‍රීඩාව ” යන්න මාතෘකාව කර ගනිමින් වාක්‍ය තුනක් ලියන්න.

(සෑම වාක්‍යයක් ම වචන පහකට නෙඅඩු විය යුතුයි. උක්ත ආඛ්‍යාත සම්බන්ධය හා අක්ෂර විනාසය නිවැරදි විය යුතුයි)

1. .....

.....

2. .....

.....

3. .....

.....

* * *